චක්‍රලේඛ අංක:- LAE/2025-76(1)

මගේ අංකය :- FE/101/2025
මැතිවරණ මහලේකම් කාර්යාලය.
සරණ මාවත,
රාජගිරිය.
2025.05. 16

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ දිස්ත්‍රික් ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06**
**මැතිවරණ කාර්යය මණ්ඩලයට ගෙවීම්**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කර ඇති 2025.05.08 දිනැති චක්‍රලේඛ අංක LAE/2025-76 කෙරෙහි අවධානය යොමු කරවමි.

02. දිස්ත්‍රික්ක කිහිපයක කාර්ය මණ්ඩල පත් කිරීම් හා ඒ සඳහා නිකුත් කර ඇති ඇතැම් පැමිණීමේ සහතික පිළිබඳව කරනු ලබන නිරන්තර විමසීම් හේතුවෙන් ඒ සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

i. තැපැල් ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා පත්කර ඇති අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට පරිබාහිරව පත්කර ඇති අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සඳහා CE-49 පැමිණීමේ සහතිකයෙන් සනාථ වන්නේ නම් ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා රු.4,250.00ක ගෙවීමක් කිරීම.

ii. ඡන්ද පොල රාජකාරි කටයුතු සඳහා සහභාගී වූ අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට CE-19/2 පැමිණීමේ සහතිකය වෙනුවට CE-19 පැමිණීමේ සහතිකය පමණක් නිකුත් කර ඇති අවස්ථා ද නිරීක්ෂණය වේ. එබැවින් අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්දපොල) ලෙස ලිඛිත පත්වීමක් ලැබ, මැතිවරණ රාජකාරිවල නිරත වී ඒ සඳහා CE-19 පැමිණීමේ සහතිකය ඉදිරිපත් කරන්නේ නම්, අතිරේක ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (ඡන්දපොල) සඳහා හිමි දීමනාව වන රු.5,000.00 ක දීමනාව ගෙවීම.

iii. LAE/2025-76 චක්‍රලේඛයේ 7.5 අනුඡේදය අනුව, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් රැගෙන යනු ලබන සහයකයා ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා යොදවා ගන්නා විට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ලබා දෙනු ලබන පත්වීම් ලිපිය කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරි විසින් අනු අත්සන් කරවා ගතයුතු බවත් ගෙවීම් කටයුතු සඳහා CE-49 අංක දරණ පැමිණීමේ සහතිකය ඉදිරිපත් කළයුතු බවත් දක්වා ඇත. එහෙත් එලෙස පත්වීම් ලිපි අනු අත්සන් කර නොගත් අවස්ථා සහ නියමිත පැමිණීමේ සහතික නිකුත් නොකළ අවස්ථාද වාර්තා වී ඇත.

ඒ අනුව, අදාල සහායකයා ඡන්ද ගණන් කිරීමේ සහයක සේවා සඳහා යොදවා ගැනීමට අවසර දී ඇති බැවින් ද, උක්ත චක්‍රලේඛයේ සඳහන් පරිදි එම සහායකගේ පත්වීම් ලිපිය කොට්ඨාස භාර සහකාර තේරීම්භාර නිලධාරී වෙතින් අනු අත්සන් කරවාගෙන නොමැති අවස්ථාවකදී හෝ CE-49 දරණ පැමිණීමේ සහතික නිකුත් නොකළ අවස්ථාවකදී වුවද ඡන්ද ගණන් කිරීමේ කාර්යය සඳහා කාර්යාල සේවක සේවයේ දීමනාව වන රු.3,000.00ක මුදල අදාල සහායකට අදාල ඡන්දපොල කාර්යය මණ්ඩල පැමිණීමේ ලේඛනය අනුව ඒ ඒ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් මඟින්, ලිපියකින් සනාථ කරන අවස්ථාවලදී ගෙවීම් කිරීම.

03. දිස්ත්‍රික්ක කිහිපයක ප්‍රමාණවත් තරම් වාහන නොමැතිවීම නිසා සහකාර තේරීම්භාර නිලධාරින්ගේ පෞද්ගලික වාහන, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ පූර්ව අනුමැතිය මත කොට්ඨාසය තුල මැතිවරණ රාජකාරි සඳහා යොදාගෙන ඇති අවස්ථාවන්හිදී චක්‍රලේඛ අංක LAE/2025-76 හි 5.3.I හා 5.3.II අනුඡේදවල සඳහන් දීමනාවන්ට අමතරව, සිය පෞද්ගලික වාහන මැතිවරණ රාජකාරි සඳහා යෙදවීමේදී ඇතිවන අවදානම සැලකිල්ලට ගෙන සම්පූර්ණ ධාවන කාලසීමාව සඳහා අමතර රුපියල් දහසක (රු.1,000.00) මුදලක් ගෙවිය යුතුය.

04. ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රමාණවත් තරම් වාහන සංචිතයක් නොමැතිවීම හා එවන් දිස්ත්‍රික්ක තුල සහකාර තේරීම්භාර නිලධාරින්ගේ පෞද්ගලික වාහන ද ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීගේ පූර්ව අනුමැතිය මත මැතිවරණ රාජකාරි සඳහා වෙනත් පෞද්ගලික කැබ් සේවා යොදවා ඇති විට එම පෞද්ගලික කැබ් සේවා සඳහා අදාල සහකාර තේරීම්භාර නිලධාරීන් විසින් සිය පෞද්ගලික මුදලින් ගෙවීම් කරන ලද බව සනාථ වන ලියවිලිද සමඟ එම වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා වවුචර්පත් අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. මෙවැනි ගමන් ගාස්තු පුතිපූර්ණය කර ගැනීමට සිදුවන සහකාර තේරීම්භාර නිලධාරින්ගේ අනෙකුත් මැතිවරණ දීමනා ගෙවීමට අදාල වවුචර්පත් ද සිය ස්ථිර සේවා ස්ථානයෙන් නොගෙවිය යුතු අතර එම වවුචර්පත් සියල්ල අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

05. තැපැල් ඡන්ද ගණන් කිරීම හෝ කොට්ඨාස භාර ඡන්ද ගණන් කිරීම අධීක්ෂණය සඳහා 2025.05.06 දින ඡන්ද ගණන් කරන අවස්ථාවේදී පත්කරන ලද සහකාර තේරීම්භාර නිලධාරින්ට අදාල සියලූ ගෙවීම්ද ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් ගෙවීම සඳහා එකී කාර්යයන්ට අදාල නිලධාරින්ගේ වවුචර්පත් සියල්ල අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ඉදිරිපත් කළයුතුය.

06. කලාප අධ්‍යාපන කාර්යාල මඟින් ගෙවීම් කටයුතු කරනු ලබන විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා පාසල්වලට අනුයුක්ත අනෙකුත් කාර්ය මණ්ඩලයට අදාල මැතිවරණ ගෙවීම් අදාල කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් ගෙවීම් කිරීමෙන් අනතුරුව රාජගිරියේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාව වෙතින් කඩිනමින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :- 1. විගණකාධිපති - දැන ගැනීම පිණිස
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කොමිෂන් සභාව දැනුවත් කිරීම සඳහා
3. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - අක්මුදල් නිදහස් කිරීම සඳහා
4. පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අක්මුදල් නිදහස් කිරීම සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැන ගැනීම පිණිස
6. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - දැන ගැනීම පිණිස